ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ

# කලා සඟරාව


සංස්කාරකවරු:

කෙරිපැහැ සෝමානන්ද
ආනන්ද කුලසූරිය
ඩී. එම්. ගුණරත්න



38 වන
කලාපය
1991 සැප්තැම්බර

# මොහෙන්ජෝදාරෝවෙන් හමු වූ මුද්‍රාවල දක්වෙන සත්ව සහ මිනිස් රූප පිළිබඳ විශ්ලේෂණයක් - I

අනුර මනතුංග

හරප්පා ශිෂ්ටාචාරයට අයත් පුරාස්ථානවලින් හමු වූ ද්‍රව්‍ය අතරින් ඉතාමත් වැදගත් සහ සිත් ගන්නා සුලු ද්‍රව්‍යය වන්නේ මුද්‍රා ය. මුද්‍රාවල දක්වෙන රූපකර්ම භාරතීය උත්තක රූකම් කලාව පිළිබඳව දක්විය හැකි ආදිතම නිදර්ශනය ය. එමෙන් ම ඒවායේ ඇති අක්ෂර ලේඛන කලාව පිළිබඳ ව භාරතයෙන් හමු වී ඇති පැරණිතම සාධකයි. හරප්පා ශිෂ්ටාචාරයේ සාමාජික, සාමයික සහ ආර්ථික ජීවිතය පිළිබඳ ව ශේෂව ඇති හොඳ ම ප්‍රකාශනය ලෙස ද මේ මුද්‍රා හැඳින්විය හැකි ය.

හරප්පා මුද්‍රා පිළිබඳ මුල්ම නිදර්ශනය ප්‍රසිද්ධියට පත් කළේ 1875 දී **කනිංහැම්** විසිනි. 1921 දී මහාපරිමාන වශයෙන් හරප්පාවේ කැණීම් පටන් ගැනීමෙන් පසු ව මේ මුද්‍රා පිළිබඳ අවධානය බෙහෙවින් වැඩි විය. 1923 දී **බැනර්ජි** විසින් මොහෙන්ජෝදාරෝවෙන් මේ වර්ගයේ මුද්‍රා රැසක් ම සොයාගනු ලැබී ය. එතැන් සිට විටින් විට කළ කැණීම්වල ප්‍රතිඵලයක් වශයෙන් 1982 වන විට මොහෙන්ජෝදරොවෙන් මුද්‍රා 1540 ක් ද, හරප්පාවෙන් 985 ක් ද, ලෝතාල්වලින් 213 ක් ද, කාලිබංගන්වලින් 99 ක් ද, චන්හුදරෝවලින් 66 ක් ද සොයා ගනු ලැබී ය. මේ ශිෂ්ටාචාරයට අයත් කුඩා නගර 15 කින් මුද්‍රා 34 ක් සහ මැදපෙරදිග පුරාස්ථානවලින් 25 ක් ද සොයා ගත් බවට වාර්තා වී ඇත.[1]

මේවායින් වැඩි කොටසක් තනා ඇත්තේ ස්ටීටයිල් ( Steatile ) නැමති මෘදු පාෂාණ වර්ගයෙනි.[2] ඒවා අළු සහ කළු පැහැති ස්ටීටයිල් යනුවෙන් දෙකොටසකට බෙදිය හැකි ය. ඒ හැරුණු විට ඇතැම් මුද්‍රා පිළිස්සූ මැටියෙන් තනා ඇත. තඹ, ඇත්දළ, ඇගේට්, කහඳ සහ Fiance ද විරල වශයෙන් මේ සඳහා භාවිත වී ඇත.

හැඩය, ස්වරූපය සහ ප්‍රමාණය අනුව මේවායේ ප්‍රභේද කීපයක් ම දුටුව හැකි ය. ඒ අතරින් වැඩි කොටසක් සමචතුරශ්‍රාකාර හෝ ඍජුකෝණාශ්‍රාකාරය. සිලින්ඩරාකාර ප්‍රිය්මාකාර, ෂඩුශාකාර සහ චක්‍රාකාර මුද්‍රා ද සුළු වශයෙන් දක්නට ඇත. බොහෝ මුද්‍රාවල ප්‍රතිමුඛයේ පිටතට නෙරාගිය කොටසක් සහිත වන අතර ඇතැම් මුද්‍රාවල ප්‍රතිමුඛය පැතලි හෝ අවතල ස්වරූපයකින් යුක්ත ය.[3]

මේවා විවිධ ප්‍රමාණයන්ගෙන් යුක්ත ය. සෙ. මී. 1.25 × 1 සිට සෙ. මී. 5 × 5 දක්වා ප්‍රමාණවල මුද්‍රා හමුවී ඇත. වැඩිම මුද්‍රා සංඛ්‍යාවක් 3 × 2 ප්‍රමාණයෙන් යුක්ත ය. නෙරාගිය කොටස අත්හැර ගත් කළ සාමාන්‍ය ඝණකම සෙ. මී. 1 ක් පමණ ය.

මේ මුද්‍රා නිපදවා ඇත්තේ කුමක් අරභයා ද යන්න ගැන මත කීපයක් ම ඉදිරිපත් වී ඇත. මේවා වෙළඳ භාණ්ඩ මුද්‍රා තැබීමට භාවිත කළ බවට පෙර සිට ම පැවති ප්‍රචලිත මතය ලෝතාල් කැණීම්වලින් පසුව සනාථ විය.[4] ලෝතාල්හි ගබඩා සංකීර්ණයෙන් හමු වූ මුද්‍රා තෙරපුම් සටහන් හැටපහක ප්‍රතිමුඛයේ වෙළඳ භාණ්ඩවල ඇසුරුම් ද්‍රව්‍ය ඇලී තිබී ඇත. එහෙත් එපමණකින් මේ සෑම 'මුද්‍රාවක්' ම වෙළඳ භාණ්ඩ මුද්‍රා තැබීම සඳහා පමණක් ම භාවිත කළ බව තීරණය කළ නො හැකි ය. ඇතැම් විට ඒ අතරින් ඇතැම් ඒවා පළඳනා සහ සංකේත ලෙස ද භාවිත වන්නට ඇත.